ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/20/01/23

# මාධ්‍ය නිවේදනය

මට්ටක්කුලිය තොටවත්ත මෙතෝදිස්ත විදුහල වසා දැමීමේ සූදානමක් පිළිබඳ පුවතක් 2022.12..30 වන දින ලංකාදීප පුවත්පතේ පළ විය. උක්ත පුවත්පත් වාර්තා පදනම් කරගෙන මෙම පාසල වාසා දැමීමේ සූදානම සම්බන්ධයෙන් 2023.01.17 වන දින බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ උතුර කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය සහ තොටවත්ත මෙතෝදිස්ත විදුහලේ විදුහල්පති යන පාර්ශ්වයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව වෙත කැඳවා කරුණු විමසන ලදී.

එම කරුණු විමසීමේදී අනාවරණ වූයේ මෙම පාසලේ සිසුන් සංඛ්‍යාව අවම මට්ටමක පැවතියත් එම පාසලේ අධ්‍යාපන ලබන සිසුන්ගේ අධ්‍යාපන හිමිකම් සුරක්ෂිත කිරීමට බස්නාහිර අධ්‍යාපන දෙපාර්තමේන්න්තුව කටයුතු කරන බවයි. කිසිදු බාධාවකින් තොරව මේවන විට මෙම පාසලේ අධ්‍යාපනයට සිසුන්ට එම පාසල තුළම තම අධ්‍යාපන කටයුතු කරගෙන යාමට ඉඩකඩ පවතින බවත් පාසල වසාදැමීම සඳහා කිසිදු සූදානමක් නොමැති බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් ශ්‍රී ලංකා මානව හිමිකම් සභාව වෙත දන්වන ලදී.

2023.01.20 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් තොටවත්ත මෙතෝදිස්ත විදුහල වෙත ගොස් එහි දරුවන් අධ්‍යාපනය ලබන ආකාරයත් පවතින පහසුකම් පිළිබඳව සොයා බැලීමක් සිදු කරන ලදී. මෙම පාසලේ දැනට අධ්‍යාපන ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව සිදු කර ගැනීමට අවශ්‍ය වන මැදිහත්වීම් සිදුකිරීමත් සහ ඊට සම්බන්ධ පාර්ශවයන් හඳුනාගැනීම මෙම ක්ෂේත්‍ර චාරිකාවේ අරමුණ විය.

ඒ අනුව දරුවන්ගේ දෛනික පැමිණීම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ මැදිහත්වීම් සහ ඊට අදාළ වන්නා වූ පාර්ශවයන් එනම් අධ්‍යාපන නිලධාරීන්, පොලිසිය, ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සම්බන්ධ කරගනිමින් වඩාත් ඉක්මන් ක්‍රියාත්මක වීමක අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. ඒ අනුව මෙම පාසලේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීමටත්, මෙම පාසල බාධාවකින් තොරව මෙම ස්ථානයේ පවත්වාගෙන යාමට අවශ්‍යවන්නා වූ මැදිහත්වීම් සම්බන්ධව අඛණ්ඩව සොයා බැලිමටත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදුකරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
2023.01.20